RARE

# ඉපැරණි ශ්‍රී ලාංකේය නර්තන හා වාදන කලාව පිළිබඳ ඓතිහාසික මූලාශ්‍රයාශ්‍රිත අධ්‍යයනයක්

RECEIVED
15 SEP 2016
Faculty of Graduate Studies
University of Kelaniya

පී.ජී. දුලංගා මධුනිකා ගුණරත්න

FGS/04/02/02/2011/01

දර්ශනපති (නර්තනය) උපාධිය පූරණය කරනු පිණිස
කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන
පර්යේෂණ නිබන්ධයකි

ප්‍රවේශ අංකය: 1254
වර්ග අංකය:

ජනවාරි 2015

# Abstract

Traditional **arts** of **dancing** and **drums** that practicing currently are evolved from Mahanuara **era**. However evidences are emphasized that different art of dancing and drums were practiced before the Mahanuara era. There was a lack of knowledge about the art of dancing and drums before the Mahanuwara era due to limited extensive researches. The main objective of this research to fulfill this knowledge gap by identifying the **sources** those give reliable evidences and facts about the ancient Sri Lankan art of dancing and drums.

The study is done based on the standard research methodology. This qualitative research has done by using reliable secondary sources (reviewing extensive literature) as well as using primary sources by visiting the archeological sites. There are lot of archeological evidences that gives clear explanation for the evolvement of the current practices of dancing and arts are from the Anuradhapura /Polonnaruwa /Dabadeniya / Yapahuwa /gampola/Kotte eras.

However we believed that most traditional art of dancing and drums are developed based on the traditional cultural rituals .Traditional art of dancing and drums were developed based or narrow and limited framework rather than evolving from ancient practices from Anuradhapura /Polonnaruwa /Dabadeniya / Yapahuwa /gampola/Kotte eras. Main objective of the research is find out whether the traditional current art of dancing and drums were evolved from Anuradhapura /Polonnaruwa /Dabadeniya / Yapahuwa /gampola/Kotte eras. So that this research will helpful traditional art of dancing and drums expand broadly by using ancient practices of arts and drums rather than stuck on the framework of traditional rituals.

Key Words : Dance, Drums, Sources, Era, Styles

## සාරාංශය

අනුරාධපුර, පොළොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ හා මහනුවර ආදී යුගයන්හි ප්‍රචලිතව පැවති නර්තන හා වාදන කලාව පිළිබඳ වන ඓතිහාසික මූලාශ්‍රය පුළුල් ලෙස අධ්‍යයනය කරමින් ඒ ඒ යුගයන්හි පැවති නර්තන හා වාදන ශෛලී පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ

මෙම පර්යේෂණ නිබන්ධය පරිච්ඡේද 7 කින් යුක්තය. පළමු පරිච්ඡේදය පර්යේෂණය පිළිබඳ හැඳින්වීමකි. අනුරාධපුර යුගයේ පැවති උත්සවවල නර්තනය භාවිත කල අවස්ථා හා වාදන අවස්ථා පිළිබඳ දෙවන පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ. තෙවන පරිච්ඡේදයේ දී පොළොන්නරු යුගයේ දෙවාල් ආශ්‍රිතව පැවති නර්තන විධි, රාජ සභායාශ්‍රිතව පැවති නර්තන විධි, හා වාදන විධික්‍රම පිළිබඳව සාකච්ඡා කෙරේ.

සිව්වන පරිච්ඡේදයේ දී දඹදෙණි, කුරුණෑගල, යාපහු තුන් ඇදුතු යුගයන්හි භාවිත තූර්ය පිළිබඳවත්, එම යුගයේ රජවරුන් සිය වින්දනය උදෙසා නර්තනය භාවිත කළ ආකාරයත් තව ද එවකට ප්‍රචලිත යාතුකර්ම පිළිබඳවත් සාකච්ඡා කෙරේ. පස්වන පරිච්ඡේදයේ දී ගම්පොළ හා කෝට්ටේ යුගයන්හි රාජසභායාශ්‍රිත නර්තන ශෛලි පිළිබඳවත්, වේශභූෂණ ක්‍රමෝපායන් හා වාදන විධික්‍රම පිළිබඳවත් සාකච්ඡා කෙරේ. හයවන පරිච්ඡේදය සංස්කෘතික ආයතන කේන්ද්‍රකොටගෙන මහනුවර යුගයේ නර්තනය හා වාදනය පැවති ආකාරය හා පෙරහැර අලංකරණය, රජුගේ විනෝදාස්වාදය උදෙසා නර්තනය භාවිත කළ ආකාරය සාකච්ඡා කෙරේ.

මෙම පර්යේෂණ නිබන්ධය අතිශය වැදගත් වනුයේ පුරාවිද්‍යා මූලාශ්‍රය සේ සැලකෙන සිතුවම්, මූර්ති රූකම් මැනවින් අධ්‍යයනය කොට ඒවායේ රේඛාමය චිත්‍ර සටහන් රැසක් ඉදිරිපත් කරමින් ඒ ඒ යුගයන්හි නර්තන හා වාදන ශෛලී පිළිබඳ නිගමනයන්ට එළඹ ඇති නිසාය.